# ශූන්‍යතාව හා හින්දු ආගම

මේ ඉතිහාසය නොදන්නා මෙරට දෙමළ ජාතිවාදීහු ද මෙරට ආරම්භයේ සිට තිබූ හින්දු ආගමක් ගැන කතා කරති. මෙරටට භාරතයෙන් පැමිණි අර්ධ වෛදිකයන් ගෙනෙන්නට ඇත්තේ අර්ධ වෛදික ආගමක් මිස හින්දු ආගමක් නො වෙයි.

ශූන්‍යතාවට වඩා අද්වෛත නිර්ගුණ බ්‍රහ්මන් තේරුම් ගැනීම මිනිසුන්ට පහසු ය. ශූන්‍යතාව ද සත්බව ගුණයෙන් යුක්ත නමුත් ඒ නැත. එනම් ඇත්තේ, පවතින්නේ, නැති බව ය. ශංකරාචාර්යයන් භාරතීය බෞද්ධයන්ගෙන් විශේෂයෙන් ම නාගර්ජුනපාදයන් වහන්සේගෙන් ලබා ගත්තේ මේ ගුණයක්, විරුද්ධාර්ථ දනවන සංකල්ප ආදිය නැති යමක පැවතීම ය. ශංකරාචාර්යවරයෝ එ පවතින දෙය අද්වෛත බ්‍රහ්මන් සමග මිශ්‍ර කර අද්වෛත නිර්ගුණ් බ්‍රහ්මන් නිර්මාණය කළ හ. එලෙස නිර්මාණය කරන ලද අද්වෛත නිර්ගුණ් බ්‍රහ්මන්ගේ පැවැත්ම යනු නැති දෙයක පැවැත්මක් නො ව ඇති දෙයක පැවැත්මකි. මිනිසුන්ට නැති දෙයක පැවැත්මට වඩා ඇති දෙයක පැවැත්ම තේරුම් ගැනීම පහසු ය. එබැවින් සාමාන්‍ය ජනයා අතර ශූන්‍යතාවට වඩා අද්වෛත නිර්ගුණ් බ්‍රහ්මන්ට පිළිගැනීමක් විය.

එහෙත් මුල දී ශංකරාචාර්යයන්ට වෛදික බමුණන්ගෙන් ම අභියෝග එල්ල විය. ඔවුන් එතුමන් දුටුවේ වෙස් වළාගත් බෞද්ධයකු ලෙස ය. එයට හේතුව වුයේ එතුමන් දෙසූ දහම බෞද්ධ ශූන්‍යතාවාදයට ඉතා සමීප වීම ය. එහෙත් පසුව වෛදිකයෝ ශංකරාචාර්යයන්ගේ දර්ශනය තමන්ට කෙතරම් වැඩදායක දැ යි තේරුම් ගත් හ. වෛදිකයෝ එතුමන්ගේ දර්ශනය ද තමන්ගේ දර්ශනයෙහි ම කොටසක් බවට පත් කර ගත් හ. අද හින්දු ආගම නමින් හැඳින්වෙන ආගම බිහි වුයේ ශංකරාචාර්යවරයාගෙන් පසුව ය. ඇතැමුන් සිතන්නේ හින්දු ආගම ඈත අතීතයේ සිට ම පැවතෙන්නක් ලෙස ය. ඔවුන්ට අනුව සිද්ධාර්ථ කුමරු ද හින්දු භක්තිකයෙකි. සර්වපල්ලි රාධක්‍රිෂ්ණන් වැනි ඉන්දීය දාර්ශනිකයන්ට අනුව සිදුහත් කුමරු හින්දුවරයකු ව ඉපිද, හින්දුවරයකු ව ජීවත් වී හින්දුවරයකු ව මිය ගියේ ය.

එහෙත් මේ අදහස් වැරැදි බව ඉන්දීය බෞද්ධයන් පෙන්වා දී ඇත. ඔවුන් සාධක සහිත ව පෙන්වා දෙන්නේ වෛදිකයන් සතුන් බිලි දුන් යාග හෝම කළ හිංසාකාර පිරිසක් බවත් පසුව බුදු දහමේ හා ජෛන දහමෙහි ආභාසය ලැබ අහිංසාව පුරුදු වූ බවත් ය. හින්දු ආගම යනු වෛදික ආගමේත්, බුදු දහමේත්, ජෛන දහමේත් මිශ්‍රණයෙන් නිර්මාණය කෙරුණු ආගමකි. එයට අවසාන වශයෙන් ආගමක් ලෙස ක්‍රියාත්මක වීම සඳහා දර්ශනය ලැබී ඇත්තේ ශංකරාචාර්යවරයාගෙනි. එබැවින් හයවැනි සියවසට පෙර භාරතයේ හින්දු ආගමක් නො වී ය.

මේ ඉතිහාසය නො දන්නා මෙරට දෙමළ ජාතිවාදීහු ද මෙරට ආරම්භයේ සිට තිබූ හින්දු ආගමක් ගැන කතා කරති. මෙරටට භාරතයෙන් පැමිණි අර්ධ වෛදිකයන් ගෙනෙන්නට ඇත්තේ අර්ධ වෛදික ආගමක් මිස හින්දු ආගමක් නො වෙයි. එකල ඇතැම් අවස්ථාවල ශිව යන වචනය යෙදිණි නම් එයට හේතුව අර්ධ වෛදික ආගම්වල ද ශිව යනුවෙන් දෙවි කෙනකු සිටීම ය. අනෙක් අතට බුදුන් වහන්සේට ද ශිව යන නම ඇතැම් විට යෙදී ඇති බව උන්වහන්සේට යෙදෙන ශිවංකර වැනි නම්වලින් පැහැදිලි වෙයි. කෙසේ වෙතත් භාරතයේ ද හයවැනි සියවසේ ඇති වූ ආගමක් පණ්ඩුකාභය රජතුමාගේ කාලයේ මෙරට තිබිය නොහැකි ය. ඉන්දීය පඬුවන් තම ආධිපත්‍යය පවත්වාගෙන යෑම සඳහා දැනුම නිර්මාණය කරන්නේ බටහිරයන් මෙන් ය. මේ ප්‍රශ්න පිළිබඳව අපේ පැත්තෙන් බලන කල පෙනෙන්නේ නම් වෙන ම චිත්‍රයකි.

ශංකරාචාර්යවරයා අවසානයේ දී කෙළේ නාගර්ජුනපාදයන් වහන්සේගේ දර්ශනය වෛදික බමුණන්ගේ යහපත වෙනුවෙන් යොදා ගැනීම ය. ඉන්පසු භාරතයෙන් බුදු දහම නැති වීම ඉක්මන් විය. භාරතයෙන් බුදු දහම නැති වී යෑමට ප්‍රධාන කරුණක් වුයේ ශංකරාචාර්යවරයන්, නාගර්ජුනපාදයන් වහන්සේගේ දර්ශනය වෙනුවට ජනතාවට පිළිගැනීමට පහසු දර්ශනයක් නිර්මාණය කිරම ය. ඒ කෙසේ වෙතත්, නාගර්ජුනපාදයන් වහන්සේගේ ශූන්‍යතාවාදය ගණිතයට ශූන්‍යය හෙවත් බිංදුව යන සංකල්පය ලබා දීමට දායක විය. ශූන්‍යතාවාදයෙන් කියැවෙන්නේ කිසිවක් නැති තැන ද පැවැත්මක් ඇති බව ය. කිසිවක් නැති ව පැවැත්මක් තිබෙන්නේ කෙසේ ද යන ප්‍රශ්නය ඇසිය හැකි ය. බිංදුව හෙවත් ශූන්‍යය යනු එසේ කිසිවක් නැති දෙයක් පවතින බව දක්වන සංකේතයකි.

© Prof. Nalin De Silva

ශුන්‍යය යන සංකල්පය භාරතයෙන් යුරෝපයට ගිය පසු එවැනි සංකල්පයක අවශ්‍යතාව කුමක් දැ යි යුරෝපීය පඬුවෝ ප්‍රශ්න කළ හ. කිසිවක් නැත්නම් ඒ බවක් කීමට කිසිවක්, එනම් ශුන්‍යය අවශ්‍ය වන්නේ ඇයි ද යන්න ඔවුන්ගේ ප්‍රශ්නය විය. වෙනත් වචනවලින් කිව හොත් ඔවුන් ඇසුවේ කිසිවක් නැති තැනක කිසිවක් තිබෙන්නේ කෙසේ ද යන්න ය. ඒක රේඛීය චින්තකයන් වූ යුරෝපීයයන්ට එවැනි ප්‍රශ්නවලට පිළිතුරු සපයා ගැනීම පහසු නැත. භාරතයෙන් යුරෝපයට ගිය ශුන්‍යය යන සංකල්පය තේරුම් ගැනීමට යුරෝපීය පඬුවන්ට සියවසක පමණ කාලයක් ගත විය.

අපට දැන් පැවැත්ම හෙවත් සත්බව (Ontology)- පිළිබඳ විවිධ මතවාද ඔස්සේ අපේ ප්‍රවාදය කුමක් ද යන ප්‍රශ්නයට පිළිතුරක් දීමට හැකි ය. සත්බව පිළිබඳ අපේ ප්‍රවාදය මෙසේ කැටි කරගත හැකි ය. ලෝකයක් යනුවෙන් හෝ එහි කොටසක් වශයෙන් කිසිවක් වාස්තවික ව නො පවතියි. වෙනත් වචනවලින් කියන්නේ නම් වාස්තවික පැවැත්මක් නොමැත. නිරපේක්ෂ සංකල්ප නැත. එනම් නිරක්ෂකයාගෙන් තොර ව පවතින සංකල්ප නො වෙයි. සංකල්පයක් යනු වචනයක් ම නො වෙයි. චිත්ත රූප ද සංකල්ප වෙයි. මිනිසුන් භාෂා නිර්මාණය කිරමට පෙර ද සංකල්ප තිබීම අවශ්‍ය ය. භාෂා කතා කරන මිනිසුන්ට පමණක් නො ව අනෙක් සත්ත්වයන්ට ද සංකල්ප වෙයි. අනෙක් සත්ත්වයන්ගේ සංකල්ප චිත්ත රූප ඇසුරෙන් පමණක් වෙයි.

සංකල්ප නිර්මාණයට භාෂාවක් අවශ්‍ය නො වුණ ද, නිරක්ෂකයන් අවශ්‍ය වෙයි. නිරක්ෂකයන් නැති තැන සංකල්ප නැත. නිරක්ෂකයකු ලෙස මෙහි දී ගැනෙන්නේ මනසක් ඇති සත්ත්වයකු ය. සංකල්ප නිර්මාණය කළ යුතු වෙයි. සංකල්ප නිර්මාණය කෙරෙන්නේ නිරික්ෂකයන් විසින් ය. නිරක්ෂකයකු විසින් නිර්මාණය කෙරෙන සංකල්පය ඒ නිරක්ෂකයාට සාපේක්ෂ වෙයි. වෙනත් නිරක්ෂකයකුට ද ඒ සංකල්පය හෝ එයට සමීප සංකල්පයක් හෝ නිර්මාණය කරගත හැකි ය. ඒ දෙවැන්නා ඒ සංකල්පය පළමුවැන්නාගෙන් ලබා ගන්නවා විය හැකි ය. ලබා ගැනීම ද නිර්මාණයක් වන්නේ දෙවැන්නා අනුකාරික ව හෝ තමන්ට එතෙක් නො තිබූ දෙයක් ඇති කර ගන්නා නිසා ය. ඒ අරුතින් ගත් කල නම් අනුකාරකයෝ ද නිර්මාණකරණයෙහි යෙදෙති. ඇතැම් විටක දෙවැන්නා ලබා ගන්නා සංකල්පය පළමුවැන්නාගේ සංකල්පයෙන් ඉතා සුළුවෙන් වුව ද වෙනස් වනවා විය හැකි ය. මේ ලිපිය කියවන්නන් සියලු දෙනා ම ඉන් ලබා ගන්නේ එක ම දැනුමක් නො වෙයි.

ලෝවැඩ සඟරාවෙහි එක් කවි පදයකින් තම තම නැණ පමණින් දැන ගත යුතු යැ යි කියැවෙයි. අපේ සාහිත්‍යයෙහි දක්නට ලැබෙන ඒ ප්‍රකාශය සංකල්ප සම්බන්ධයෙන් ගත් කල ඉතා වටිනා එකක් වෙයි. යමකුට සංකල්පයක් තේරෙන්නේ යමකුගේ ඥානය පරිදි ය. ඒ ඒ පුද්ගලයා ජෛවීය ව, සංස්කෘතික ව හා සංසාරික ව ගත් කල එකිනෙකාගෙන් වෙනස් වෙයි. සංකල්ප ලබා ගන්නෝ එවැනි වෙනස් වූ පුද්ගලයෝ වෙති. එබැවින් ඒ වෙනස් පුද්ගලයන් එක ම සංකල්පයක් ලබා ගැනිතැ යි කිව හැකි නො වෙයි. සත්ත්වයන් සංකල්ප නිර්මාණය කරන්නේ මනසින් ය. මනස ඉන්ද්‍රියක් ලෙස මෙන් ම සංකල්ප නිර්මාණය කරන්නා ලෙස ද ක්‍රියා කරයි.

සත්ත්වයන්ට සංකල්ප නිර්මාණයෙහි දී විරුද්ධාර්ථ ගෙන දෙන සංකල්ප ද වැදගත් වෙයි. සෑම විටක ම පාහේ සත්ත්වයකු සංකල්පයක් නිර්මාණය කර ගන්නේ එනම්, තේරුම් ගන්නේ එහි විරුද්ධාර්ථය ද තේරුම් ගනිමින් ය. එනම්, නිර්මාණය කරමින් ය. සංකල්පයකට තිබිය හැක්කේ එක් විරුද්ධාර්ථයක් පමණක් නො වෙයි. සංකල්පයකට විවිධ මානවල විවිධ විරුද්ධාර්ථ තිබිය හැකි ය. සංකල්පයක එක් මානයක පමණක් විරුද්ධාර්ථය සැලකීමෙන් ලැබෙන්නේ සංකල්පයෙහි ඒ මානයෙහි තෙරුම පමණකි. සංකල්පයක් තේරුම් ගැනීමට ඒ සියලු මානවල විරුද්ධාර්ථ තේරුම් ගැනීමට, එනම් නිර්මාණය කිරම අවශ්‍ය වෙයි.

සංකල්පයක් තේරුම් ගැනීම යනු ඒ සංකල්පය නිර්මාණය කිරම මිස වෙනත් දෙයක් නො වෙයි. සංකල්පයක් යනු නිරක්ෂකයාගෙන් තොර ව පවත්නා දෙයකට නිරක්ෂකයා දෙන නමක් නො වෙයි. ඒ ඊනියා දෙය යනු සංකල්පය ම වෙයි. ලෝකය යනුවෙන් නිරක්ෂකයාගෙන් තොර ව යමක් නො පවතියි. ලෝකය යනු නිරක්ෂකයාගේ ලෝකයයි. ඒ නිර්මාණය කරනු ලබන්නේ නිරක්ෂකයා විසින් ය. ලෝකය හා ලෝකය පිළිබඳ දැනුම යනුවෙන් දෙකක් නො පවතියි. නිරක්ෂකයකුගේ ලෝකය හා ලෝකය පිළිබඳ දැනුම එකක් ම ය. නිරක්ෂකයකුගේ ලෝකය යනු ඒ නිරක්ෂකයා ලෝකය යනුවෙන් දන්නා දැනුම ය.

© Prof. Nalin De Silva

එබැවින් යම්කිසි දෙයකට ස්වභාවයක් යනුවෙන් සත්තාවක් නො පවතියි. නිරීක්ෂකයකුගෙන් තොර ව යමක් නො පවතිනවා මෙන් ම යමක ස්වභාවය යනුවෙන් ද දෙයක්, ගුණයක්, ධර්මතාවක් නො පවතියි. යමක ඊනියා ස්වභාවය ද නිරීක්ෂකයාගේ නිර්මාණයක් වෙයි. මෙයින් කියැවෙන තවත් කරුණක් වනුයේ නිරීක්ෂකයාගෙන් තොර ව, එනම් නිරීක්ෂකයාගෙන් ස්වායත්ත ව ධර්ම ද නො පවතින බව ය. ධර්ම යනුවෙන් හැඳින්වෙන්නේ මනසට ගත හැකි කුඩා ම සංකල්ප ය. මෙහි කුඩා ම සංකල්පයක් යනුවෙන් කියැවෙන්නේ සංකල්පයක් ලෙස ගත හැකි තරමට මනසට සාපේක්ෂව පවතින කුඩා ම කාලයක නිර්මාණය කෙරෙන සංකල්පයකි.

මනසට අල්ලාගත හැකි කුඩා ම කාල පරිච්ඡේදයක් වෙයි. මෙයින් කියැවෙන්නේ මනසින් තොර ව කාලය යනුවෙන් යමක් පවතින බව හා මනසට ඉන් ගත හැකි කුඩා කොටසක් පවතින බව නො වෙයි. අපේ වචන භාවිතය විසින් අප සව්ඥානික නොවුණ හොත් බොහෝ විට අප නොමග යැවීමට ඉඩ ඇත. කාලය යනු ද නිරීක්ෂකයාගේ නිර්මාණයකි. කාලය පකද්කදත්තියකැ යි ථෙරවාදයෙහි සඳහන් වෙයි. නිරීක්ෂකයාට නිර්මාණය කළ හැකි කුඩා ම කාල පාරිච්ඡේදයක් වෙයි. මනසට අල්ලාගත හැකි කුඩා ම කාල පරිච්ඡේදය යනු නිරීක්ෂකයාට එසේ නිර්මාණය කළ හැකි කුඩා ම කාල පරිච්ඡේදය වෙයි. මේ කුඩා කාල පරිච්ඡේදය ඒ ඒ නිරීක්ෂකයා අනුව වෙනස් වෙනවා විය හැකි ය. එහෙත් ඕනෑ ම පෘථග්ජන නිරීක්ෂකයකුට නිර්මාණය කළ හැකි කුඩා ම කාල පරිච්ඡේදයක් වෙයි.

ථෙරවාදයෙහි ධර්ම යනුවෙන් කියැවෙන්නේ මේ කුඩා කාල පරිච්ඡේදයෙහි නිරීක්ෂකයකුට නිර්මාණය කළ හැකි සංකල්පවලට ය. ඒ අරුතින් ගත් කල ධර්ම ද සාපේක්ෂ වෙයි. ධර්ම ද සාපේක්ෂ වන්නේ නිරීක්ෂකයාට ය. එනම්, නිරීක්ෂකයාගේ මනසට ය. නිරීක්ෂකයකුට නිර්මාණය කළ හැකි කුඩා ම කාල පරිච්ඡේදය යනු නිරීක්ෂකයාගේ මනසට නිර්මාණය කළ හැකි කුඩා ම කාල පරිච්ඡේදය මිස අනෙකක් නො වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva